| | | |
|---|---|---|
| තේමාව | : | අපේ නිවස |
| විෂය | : | තොරතුරු සන්නිවේදන තාක්ෂණය |
| පන්තිය | : | 6 ශ්‍රේණිය |
| පාඩම | : | 5 ඇල්ගොරිතම හා ගැලීම් සටහන් |
| අරමුණු | : | 5.1 ප්‍රායෝගික ගැටලු විසදීමේ ක්‍රියාවලිය. |
| | | 5.2 ඇල්ගොරිතම හඳුනා ගැනීම |
| | | 5.2.2 ඇල්ගොරිතම ලිවීම |

1. පෙර ඉගෙනුම :
   I. ඔබේ නිවසේ සිටින වැඩිහිටියන් තේ සෑදීමේදී අනුගමනය කරන පියවර නිරීක්ෂණය කරන්න
   II. වැඩිහිටි අනුදැනුම ඇතිව තනිව තේ කෝප්පයක් සාදන්න
   III. වෙසක් උත්සවය සඳහා නිවැසියන් එක්ව නිම කල පහන් කූඩු පිළිබඳ ආවර්ජනය කරන්න
   IV. පහන් කූඩුවක් සෑදීමට ඔබට අවශ්‍ය කල ද්‍රව්‍ය සටහන් කරන්න
   V. ඉහත ඔබ සටහන් කල ද්‍රව්‍ය රැස් කිරීමෙන් පසු ඔබ කල දෑ විස්තර කරන්න
   VI. අවසානයේ ඔබ සතුටට පත්කල පහන් කූඩුව ආවර්ජනය කරන්න
   VII. ඔබේ නිවැසියන් සමග එක්ව ඔබ සිදු කල තවත් මෙවැනි ක්‍රියාකාරකම් වල ලැයිස්තුවක් සාදන්න

2. පන්තිකාමර ඉගෙනුම
   I. ඉහත නිවසේදී සිදුකල සෑම ක්‍රියාකාරකමකටම පළමුව අමුද්‍රව්‍ය අවශ්‍ය වූ බව වටහා ගනී
   II. අමුද්‍රව්‍ය භාවිතා කොට පියවර වශයෙන් ක්‍රියාවන් සිදුකල යුතු බව හඳුනා ගනී
   III. අමුද්‍රව්‍ය ක්‍රියාවලියකට භාජනය කිරීමෙන් ප්‍රතිඵල ලැබෙන බව වටහා ගනී
   IV. ඉහත ක්‍රියාකාරකම් කණ්ඩායම් වශයෙන් ඩිමයි කොල වල සටහන් කර පන්තියට ඉදිරිපත් කරයි
   V. අමුද්‍රව්‍ය ආදාන ලෙසත් අනුගමනය කරන පියවර ක්‍රියාවලිය ලෙසත් අවසාන ප්‍රතිඵලය ප්‍රතිදානය ලෙසත් දක්වයි.
   VI. ඕනෑම ගැටලුවක් විසදීම සඳහා එහි ආදාන,ක්‍රියාවලිය,ප්‍රතිදාන හඳුනා ගැනීමේ අවශ්‍යතාවය පන්තියට විස්තර කරයි
   VII. ඉහත ක්‍රියාකාරකම් වලට අදාල ඇල්ගොරිතම තනිව ලියයි

3. පසු ඉගෙනුම
   I. 5.2 ක්‍රියාකාරකම තනිව සිදු කරයි.
   II. නිවසේදී සිදුකරන විවිධ ක්‍රියාකාරකම් 10කට අදාල ඇල්ගොරිතම තනිව ලියයි
   III. තමන් සිදුකරන විවිධ ක්‍රියාකාරකම් සඳහා සිතින් ගැටලු විශ්ලේෂණය සිදුකරයි.
   IV. සෑම ගැටලුවක්ම විශ්ලේෂණය මගින් එය විසදීම පහසු බව වටහා ගනී.

4. පාඩම ඉගෙනීම සඳහා අවශ්‍ය සහය ලබාගත හැකි මුද්‍රිත ශ්‍රව්‍ය දෘෂ්‍ය ඔන්ලයින් මාධ්‍ය
   I. https://www.google.lk/search?q=algorithm+for+kids&tbm=isch&hl=en&chips=q:algorithm+for+kids,g_1:activity:FW2Wo2aF-aY%3D&sa=X&ved=2ahUKEwjo-czDs77xAhVU4HMBHfsyBkMQ4lYoA3oECAEQHg&biw=1349&bih=657

   II. https://www.youtube.com/watch?v=kM9ASKAni_s

   III. https://www.youtube.com/watch?v=Da5TOXCwLSg

IV. https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=1323&lang=si

V. Unlimited learning opportunities….


By Chathurangika Wijayathilaka

KG/MW/Sujatha Vidyalaya,Rambukkana












